# 2023.01.05 දින කර්මාන්ත කමිටු වාර්ථාව

2023 ක් වූ ජනවාරි මස 05 වන දින පෙ.ව 10.30 ට පමණ ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කඹුරුපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ රැස්වීම් ශාලාවේදී පැවති කර්මාන්ත කමිටු වාර්තාව.

**පැමිණීම**

ගරු සභාපති - ආනන්ද වීරසිංහ මහතා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දිනේෂ් ලොකුගමගේ මහතා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - වොලනි කාවින්දි මෙනවිය
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - උපුල් ප්‍රියන්ත ගමගේ මහතා

**නොපැමිණීම**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පේමවංශ වර්ණකුල මහතා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පද්මසිරි සූරියආරච්චි මහතා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මොරිස් වසන්ත දිල්ලිමුණි මහතා

පැමිණි පිරිස ගරු සභාපති ආනන්ද වීරසිංහ මහතා විසින් පිළිගැනීමෙන් අනතුරුව කමිටුවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

**01. කාර්යාල ගොඩනැගිල්ලේ ඉහල මාලය ඉදිකිරීම.**

ව්‍යාපෘතිය ඉදිකිරීම අදියර 2ක් යටතේ ක්‍රියාත්මක කිරීමට නිර්දේශ විය.

I. අදියර - 2,000,000.00
II. අදියර - 1,500,000.00

2 අදියර යටතේ ඉහල මාලයට පිවිසීම සඳහා රවුම් යකඩ පඩිපෙලක් සවි කිරීමට යෝජිතව තිබුනද කාර්යාලයේ වැඩි පිරිස කාන්තාවන් වන අතර, සාරිය අඳින පිරිස් වැඩි බැවින් ඉහල නැගීමේ සහ බැසීමේ අපහසුව නිසා පඩි සහිත L හැඩයේ තරප්පුවක් සැකසීම සුදුසු වන අතර ඒ සඳහා අනුමත ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේ. තවද පඩි පෙල සැකසිමේදි පැරණි ගොඩනැගිල්ලේ වහලේ කොටසක් කපා ඉවත් කර නැවත සකස් කල යුතුය.

එබැවින් ඒ සඳහා අදාල කාර්යය ඉටු කිරීම සුදුසු බවත් ඒ සඳහා අනුමැතියට ඉදිරිපත් කරමි. ඒ සඳහා ඉහත කර්මාන්ත ඉටු කල ස්වේච්ඡා සමිතියට රු. 1,200,000.00 ක මුදලක් වෙන් වේ.

**නිර්දේශය:-** ඉහත කරුණු සලකා බලා ඇස්තමේන්තු සකස් කර අඩුපාඩු සකස් කිරීමට නිර්දේශ කරන ලදී.

**02 2023.01.05 දින කර්මාන්ත කමිටු වාර්ථාව**

**02. කද්දුව පුස්තකාලය උඩුමහල ඉදිකිරීම**

මෙම ව්‍යාපෘතිය අදියර 2 ක් යටතේ සිදු කිරීමට යෝජනා වූ අතර, එහි අදියර 1 යටතේ නිලධාරීන් සඳහා වූ කාමරය ටයිල් කිරීමට පමණක් ඇස්තමේන්තු කර ඇත.

මේ වන විට එහි ඉදිකිරීම් ආරම්භ කර ඇත. එහි 1 අදියර යටතේ ගොඩනැගිල්ලේ ගෙබිම නිලධාරී සඳහා වූ කාමරය ටයිල් කිරීමටත්, ඉතිරි කොටස සිමෙන්ති මැදිමටත් ඇස්තමේන්තු කර ඇත නමුත් පුස්තකාල සහායක විසින් බිම කොටසද ටයිල් කිරීම සිදු කර දෙන ලෙසද ඉල්ලා සිටි. තවද පවතින වැසිකිලිය අලුත්වැඩියාව සහ ඉදිරිපස දැල් වැටක් ගසා පුස්තකාල භූමිය වෙන්කර දෙන ලෙසද ඉල්ලා සිටි.

ඉහත කරුණු ඉටු කිරීම සඳහා අනුමත ඇස්තමේන්තු තුල මුදල් ප්‍රතිපාදන නොමැති බැවින් ඒ සඳහා වෙනම ඇස්තමේන්තුවක් සකස් කල යුතුය.

**නිර්දේශය:-** ඉහත කරුණු සලකා බලා වෙනම ඇස්තමේන්තුවක් මඟින් ඉහත සදහන් අඩුපාඩු සකස් කිරීමට නිර්දේශ කරන ලදි.

**03. වාහන අංගනය දීර්ඝ කිරීම.**

දැනට ඉදිකර ඇති වාහන අංගනයට පිටු පස ඉතිරි වී ඇති භූමිය වාහන සේදීමට සහ නිලධාරීන්ගේ යතුරු පැදි නැවැත්වීම සඳහා වහලයක් සහිතව භූමිය කොන්ක්‍රීට් කිරීම.

**නිර්දේශය:-** ඉහත කරුණු සලකා බලා වෙනම ඇස්තමේන්තුවක් මඟින් සකස් කිරීමට නිර්දේශය කරන ලදි.

**04. කාර්යාල පිටුපස කාණුව කොන්ක්‍රීට් කිරීම.**

කාර්යාලය පිටුපස වැසි ජලය එකතු වීම නිසා වැසිකිලි වල පිරීම නිතර සිදුවන අතර, එය වැලැක්වීම සදහා ඉඩම මායිමෙන් ප්‍රධාන ගේට්ටුව අසල තිබෙන කොන්ක්‍රීට් කාණුවට සම්බන්ධ වන සේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම.

**නිර්දේශය**: ඉහත කරුණු සලකා බලා වෙනම ඇස්තමේන්තුවක් මඟින් සකස් කිරීමට නිර්දේශ කරන ලදි.

**05. සභා අරමුදල් - මන්ත්‍රී යෝජිත 2023.**

කඹුරුපිටිය සභා අරමුදල් යටතේ 2023 වර්ෂය සඳහා කඹුරුපිටිය ප්‍රාදේශිය සභා කොට්ඨාශ භාර මන්ත්‍රීවරුන් වෙනුවෙන් රු.500,000.00 ක ප්‍රතිපාදන වෙන්කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා ඇත. එම වැඩසටහනට අදාලව ඉදිරිපත් කරන ලද යෝජනා සඳහා සභාවේ නිර්දේශය ලබා ගැනිමට ඉදිරිපත් කරමි.

**03 2023.01.05 දින කර්මාන්ත කමිටු වාර්ථාව**

| අනු අංකය | ග්‍රාම නිලධාරි කොට්ඨාශය | මන්ත්‍රීතුමාගේ නම | ව්‍යාපෘති යෝජනාව |
|---|---|---|---|
| 01 | උල්ලල | ගරු සභාපති ආනන්ද විරසිංහ මහතා | උල්ලල මුරුත්‍තපිටිය මාර්ගය සංවර්ධනය කිරිම |
| 02 | ගතාර උතුර | ගරු මන්ත්‍රී අතුල විරසිංහ මහතා | යකදූරු ගෙදර මාර්ගය පස්දමා සංවර්ධනය කිරිම - රු.250,000.00 |
| | | ගරු මන්ත්‍රී -අතුල විරසිංහ මහතා | පලාවිල මහවේල්ල පස්දමා සංවර්ධනය කිරිම - රු.250,000.00 |

| | | | |
|---|---|---|---|
| 03 | ඉහල විටියල | ගරු උප සභාපති - දුමින්ද පුෂ්පකුමාර මහතා | ඉහල විටියල ග්‍රමා නිලධාරි වසමේ තල්වත්ත සිට පිටමුල්ල හරහා මාපලාන දක්වා කරන පa1ධාන මාර්ගයේ ගඟට කැඩී ඇති කොටස් නැවත පිලිසකර කිරිම. |
| 04 | නාරන්දෙණිය | ගරු මන්ත්‍රි-රෙජි වෙල්ලප්පිලි මහතා | ඊරියතොට පොදු ගොඩනැගිල්ල වහල සඳහා ඇස්බැස්ටොස් ෂීට් ලබා ගැනිම සහ ඉතිරි වැඩ සඳහා රු.250,000.00 |
| | | | ඊරියතොට උඩහහේන මාර්ගය සමගි මාවත කදු කොටස කපා පහත් කිරිම ඇල්හේනදොනය මාර්ගය හා ජයපෝෂිතගම මාර්ගය සංවර්ධනය කිරිම රු.250,000.00 |
| 05 | මාපලාන | ගරු මන්ත්‍රී දීප්ති අබේනායක මහතා | මාපලාන කොට්ඨාසයේ ප්‍රජා ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම සහ එම ළිඳට බසින පඩිපෙළ සංවර්ධනය කිරීම. |
| 06 | කරගොඩ උයන්ගොඩ | ගරු මන්ත්‍රීනී මනෝරි සමරවික්‍රම මිය | නෙල්ලිගහ කොරටුව මාර්ගය පස් දමා සංවර්ධනය කිරීම.<br>සිරිවිමන මාර්ගයේ කදු කොටස කපා ඉවත් කිරීම.<br>නාකන්දපුර සිරිපාල මහතාගේ නිවස අසලින් පන්සල දක්වා ඇති මාර්ගයෙන් කදු කොටස කපා ඉවත් කිරිම. |

06. 2023 සංවර්ධන යෝජනා යටතේ මාපලාන කොට්ඨාශයෙහි වොලනි කාවින්දි මන්ත්‍රීතුමියගේ යෝජනාවක් වන සීවැල්ගම ග්‍රාම නිලධාරි වසමේ පුහුල්හේන,හෙරිටේජ් පාර්ක් ඉඩමෙහි මාර්ගයේ මුල සිට වට රවුම් මාර්ගයෙහි කැඩී ඇති කොටස් බැකෝ යන්ත්‍රයක් යොදා සකස් කිරිම යෝජනාව නිර්දේශ කරන ලදි.(රු.100000.00)

06. මිට අමතරව,

I. ඊරියතොට පැරණි ජල ටැංකිය සඳහා නව ජල මෝටරයක් සවි කිරිම.
II. කඹුරුපිටිය ප්‍රාදේශිය සභාවේ රටලංකාවත්ත නව අදාහානාගාර සේවකයන් හට ඇදුම් මාරු කිරිමට සහ විවේක ගැනිම සඳහා කාමරයක් සකස් දිම.
III. කඹුරුපිටිය ප්‍රාදේශිය සභාවට අයත් කරපුටුගල ජල පොම්පාගාරයේ ඉදිකර ඇති පාලම ගංවතුර හේතුවෙන් කැඩී ඇති බැවින් එම පාලම අලුත්වැඩියා කිරිම

යන යෝජනාවන් ඉටු කිරිම සඳහා කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදි.

07. කඹුරුපිටිය ප්‍රාදේශිය සභා බලප්‍රදේශය තුල පසුගිය වර්ෂයන්හි සිදුකරන ලද පහත සදහන් මාර්ග,පැතිබැමි හා ජල යෝජනා ක්‍රමයන්ට අදාලව ගෙවිය යුතු හිඟ මුදල් අදාල පාර්ශවයන් සඳහා ගෙවිම් කටයුතු කිරිම සම්බන්ධයෙන් පත් කරන ලද කමිටුව මඟින් පහත නිර්දේශයන් ලබා ගන්නා ලදි.

I. **කරගොඩ උයන්ගොඩ මහා විද්‍යාලය මාර්ගයේ අතුරු මාර්ගය (1 අදියර)**

ගැටලු සහගත පැතිබැම්මෙහි පළුදු වු ස්ථානයේ සිට දෙපැත්තට අඩි 10×10 දුරක ගෙවිම් නතර කර ඉතිරි මුදල ගෙවිමට නිර්දේශ කරමි. තවද එම මාර්ගයේ අතුරා ඇති ඉන්ටලොක් ගල් 2 ක් ගලවා එහි සම්පීඩතා ශක්තිය රසායනාගරය මඟින් පරික්ෂා කිරිමෙන් අනතුරුව ගෙවිම් සිදු කිරිමටත් නිර්දේශ කරමි.

II. **බිබුලවෙල ලේනබටුව මාර්ගයේ පාඩිය කුඹුර පැති බැම්ම ඉදිකිරිම.**

එක ගමකට එක් වැඩක් වැඩසටහන අවිච්ඡේද ව්‍යාපෘති - 2015 යටතේ කඹුරුපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා සම්බන්ධ වෙමින් සිදුකරන ලද ඉහත කර්මාන්තයේ ගෙවිම් සම්බන්ධ අවශ්‍ය ලේඛන කඹුරුපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත

ඉදිරිපත් කර ඇති බැවින් ඒ සම්බන්ධව මාතර දිස්ත්‍රික් කාර්යාලය මඟින් විමසීම් සිදුකර තිරණයක් ගැනීමට කමිටුව නිර්දේශ කරන ලදි.

III. **ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරීම ජාතික වැඩසටහන - 2016 ප්‍රාදේශිය සභා වැසිකිලිය ඉදිකිරීම**.

අදාල ව්‍යාපෘති සාර්ථකව අවසන් කර මේ වන විට කාර්යාලයෙහි සියලුම නිලධාරින් ප්‍රයෝජනයට ගන්නා බැවින් ව්‍යාපෘතිය මඟින් ගිණුමට එවන ලද මුදල වන රු.302,040.80 ක මුදල ගෙවීමට නිර්දේශ කරන ලදි.

IV. ජල ව්‍යාපෘතිය

**05 2023.01.05 දින කර්මාන්ත කමිටු වාර්ථාව**

දකුණු පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මඟින් පළාත් නිශ්චිත ප්‍රධාන යටතේ ඉටු කරන ලද ඉහත කර්මාන්තය සඳහා අදාල මුදල් කර්මාන්ත ගිණුමට එවා ඇති ඇති බැවින් එම මුදල් ජල ව්‍යාපෘතිය සඳහා ගෙවිමට කමිටුව නිර්දේශ කරන ලදි.

ඒ අනුව ඉහත කර්මාන්ත සඳහා ගෙවිමට ඇති හිඟ මුදල් සම්බන්ධයෙන් පත්කරන ලද කමිටුව නිර්දේශ ලබා දි ඇති අතර, එම කමිටු නිර්දේශ අනුව අදාල ලිපි ගොනු පරීක්ෂා කර බලා විධිමත් පරිදි ගෙවිම් කටයුතු කිරීමට කර්මාන්ත කමිටුව නිර්දේශ කරන ලදි.

**08. කඹුරුපිටිය ආදාහනාගාරය ද්විත්වකරණය කිරීම.**

කඹුරුපිටිය ආදාහනාගාරය ද්විත්වකරණය කිරීම ගොඩනැගිල්ලේ වැඩ කොටස් සඳහා අදාළ ඇස්තමේන්තුව 2022.11.09 දිනැතිව මාතර පළාත් සහකාර කොමසාරිස් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු වෙත ඉදිරිපත් කර ඇත. නමුත් 2022.11.14 වැඩ පටන් ගත් දිනය වන විට අදාළ ඇස්තමේන්තුවේ පිටපතක් අප වෙත ලැබී නොතිබුණු අතර ඇස්තමේන්තුව අනුමත කිරීමට අදාළ තොරතුරු අප කාර්මික නිළධාරි විසින් පළාත් සහකාර කොමසාරිස් කාර්යාලයේ ඉංජිනේරු සහකාර සමඟ ඇස්තමේන්තුව පරීක්ෂා කිරීමට අදාළ තොරතුරු ලබා දී තිබූ බැවින් සේවා අවශ්‍යතාවය මත සභාපතිතුමා විසින් ලබා දුන් වාචික උපදෙස් මත අදාළ ඇස්තමේන්තුවේ වැඩ කොටස් ආරම්භ කරන ලදි.

විගණන දිනය වන 2022.12.21 දින වන විටද අනුමත ඇස්තමේන්තුවේ පිටපතක් අප වෙත ලැබී නොතිබුණු අතර එදින වන විට ගොඩනැගිල්ලේ අත්තිවාරමේ සිට වහලය දක්වා ඉදිකිරීම් අවසන් කර තිබිණ. තවද අනුමත ඇස්තමේන්තුව ලැබුණේ 2022.12.29 දින ය.

ඉහත කරුණු සලකා බලා විගණන දිනය වන විට නිම කර තිබූ වැඩ කොටස් සඳහා බිල්පත් පරීක්ෂා කිරීම පළාත් සහකාර කොමසාරිස් කාර්යාලය ප්‍රතික්ෂේප කළහොත් ඒ සඳහා වූ වියදම් සභාවේ තාක්ෂණික නිළධාරීන් විසින් ආරම්භයේ සිට අධීක්ෂණය කළ බැවින් තාක්ෂනික නිළධාරි වාර්තාව අනුව ගෙවීම් කිරීම සුදුසු බවට නිර්දේශ කරමි.

අද දිනට නියමිත වැඩ කටයුතු අවසන් බව දැන්වීමෙන් අනතුරුව කර්මාන්ත කමිටුවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

ආනන්ද වීරසිංහ,
සභාපති,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.